ටිබෙටයේ දී ටිබෙට් බසට අනුවාද වූ අතර මේ සියල්ල පසුකාලයේ පිටක දෙකක් වශයෙන් බෙදන ලදි.

ටිබෙට් ත්‍රිපිටකය අපට දැකිය හැක්කේ පාලි ත්‍රිපිටකය හෝ බොහෝ සෙයින් සර්වාස්තිවාදී නිකායයට අයත් වූ ත්‍රිපිටක කෘති ආශ්‍රයෙන් චීන බසට පරිවර්තනය වී සකස් වූ චීන ත්‍රිපිටකය මෙන් එක් සම්ප්‍රදායකට අයත් ත්‍රිපිටකයක් ලෙස නොවේ. ඒ අනුව විවිධ සම්ප්‍රදායන් අයත් වූ බුද්ධ දේශනා ලෙස පිළිගැනෙන සූත්‍ර (Do), විනය (Dulva), අභිධර්ම (Rgyud) ආදී අංග 7ක් කන්-ජූර් පිටකයට ඇතුළත් කරන ලද අතර ඉහත දක්වූ ව්‍යාඛ්‍යානාදී ලක්ෂණවලින් යුතු කෘති හා වෙනත් ලෞකික විෂයන්ට අයත් ශිල්ප ග්‍රන්ථ හා ප්‍රාමාණික ග්‍රන්ථ ටන්ජූර් පිටකයට ඇතුළත් කරන ලදි. කෙසේ නමුත් කන්-ජූර් පිටකය වඩාත් ගෞරවාදරයට ලක් විය. එක් අතකින් බුද්ධ දේශනා ලෙස සැලකීමත්, සම්භාව්‍ය බෞද්ධ යුගයේ අනුවාද වීමත් කීර්තිමත් බෞද්ධ පඬිවරුන් විසින් අනුවාදිත කෘති වීමත් කන්-ජූර් පිටකයේ වැදගත්කමට හේතු විය.

**ටන්-ජූර් පිටක සාහිත්‍යය බිහි වීම :** ක්‍රි.ව. 7 වැනි සියවසේ දී ටිබෙටයේ රාජ්‍ය පදප්‍රාප්ත ස්‍රොං-බ්ත්සන්-ස්ගම්-පෝ රජු විසින් ටිබෙටයට බුදුසමය හඳුන්වා දීමෙන් පසු භාරතයෙන් ටිබෙටයට පැමිණි ශාන්තරක්ෂිත හා පද්මසම්භව වැනි බෞද්ධාචාර්යවරුන්ගේ ආගමික කර්තව්‍යන්හි මුඛ්‍ය කාර්යයක් වූයේ බෞද්ධ කෘති ටිබෙට් භාෂාවට අනුවාද කිරීමයි. බෞද්ධ කෘති ටිබෙට් භාෂාවට පරිවර්තනය වීමට සමගාමීව සතවර්ෂ ගණනාවක් තිස්සේ සිදු වූ ටිබෙට් බෞද්ධ සාහිත්‍යයේ සංවර්ධන අවධි දෙකක් පෙන්වා දිය හැකිය. ටිබෙටය දේශපාලනික වශයෙන් ස්ථාවරව සමෘද්ධිමත් වූ මේ යුගයන්හි ධර්ම ශාස්ත්‍රීය කටයුතු සඳහා අනුපමේය දායකත්වයක් ලැබුණි. පළමු යුගයේ ක්‍රි.ව. 7වන සියවසින් ආරම්භ ව ක්‍රි.ව. 842න් අවසන් විය. ඒ එවක පැවැති ටිබෙට් අධිරාජ්‍ය බිඳ වැටීම හේතුවෙනි. භාරතීය හා තිබ්බතීය බෞද්ධ විද්වත් මණ්ඩලයක් විසින් සංස්කෘත තිබ්බතීය පාරිභාෂික ශබ්දකෝෂයක් නිපද වූ රල්-පා-චෙන් රාජ්‍ය සමය මෙම මුල් යුගයට අයත් ය. දෙවන යුගය දහවන සියවසේ අග භාගයේ සිට 14 වන සියවස දක්වා පැවතුණි. භාරතයේ මුස්ලිම් ආක්‍රමණ නිසා භාරතීය බුදු සමය පරිහාණියට පත් වීමට සමගාමී ව ක්‍රි.ව.12 වන සියවසේ සිට ටිබෙට් බෞද්ධ සාහිත්‍යයේ සංවර්ධනය ද අඩාල විය. කෙසේ වුවත් තවත් ශතවර්ෂ කිහිපයක් තුළ අඛණ්ඩව මෙම ටිබෙට් සාහිත්‍ය ව්‍යාපාරය පැවතුණි.

ටිබෙට් බෞද්ධ සාහිත්‍යයේ සංවර්ධනය කෙතරම් වේගවත් වූයේ ද යත් ටිබෙට් පිටකද්වයේ ග්‍රන්ථවලින් වැඩි ප්‍රමාණයක් බුදු සමය හඳුන්වා දීමේ සිට ගත වූ මුල් සියවස කිහිපය තුළ අනුවාදිතව තිබිණි. කන්ජූර් පිටක-යේ පසු කාලීන (Rgyud gsar ma) තන්ත්‍ර හා කාලචක්‍රව්‍යාඛ්‍යානය යන කොටස් හා ටන්ජූර් පිටකයේ පසුව සඳහන් කරන සූත්‍ර (Mdo) පසු කාලයට අයත් රචනා ය. කාලචක්‍ර සංකල්පය බුදුසමයට ඇතුළත් වූයේ ක්‍රි.ව. 11 වන සියවසේ දී ය. ටන්ජූර් පිටකයේ සූත්‍ර කොටස්වල විවිධත්වය නිසා එම කොටස් නිම වීමට 17 වන ශතවර්ෂය තෙක් ශතවර්ෂ ගණනාවක් ගත වන්නට ඇත. එහෙත් එහි මහායාන වෛපුල්‍ය සූත්‍රයන්ට හා දර්ශනයන්ට අයත් ව්‍යාඛ්‍යාන කොටස් මුලින් රචනා වූ බව පැහැදිලි ය. ඒ අනුව ටිබෙටයට බුදුසමය හඳුන්වා දීමෙන් ගත වූ මුල් සියවස් පහක පමණ කාලය තුළ මෙම පිටකද්වයට අදාළ වැදගත් බොහෝ කෘති සකස් වී තිබුණු බව පැහැදලි වේ.

ක්‍රි.ව. 9 වන සියවස මුල් භාගය වන විට ටිබෙට් බෞද්ධ සාහිත්‍යයේ දහස් ගණනක් වූ මෙම කෘති නිසි වර්ගීකරණයකට ලක් කිරීමේ අවශ්‍යතාව දැනුණි. එක් ග්‍රන්ථයක අන්තර්ගතයේ වෙනස්කම් සහිත විවිධ පිටපත් තිබීම මෙම වර්ගීකරණ සඳහා හේතු වූ ප්‍රධාන කරුණකි. ඒ වන විට චීන බෞද්ධ සාහිත්‍ය කෘති විධිමත් ව සංස්කරණය කර වර්ගීකරණය කර සූචිගත කර තිබීම ටිබෙට් බෞද්ධ සාහිත්‍යය වර්ගීකරණය කිරීම සඳහා වඩාත් පහසුවක් විය. එසේ සකස් වූ පළමු සූචිය දෙන් කර්ම (Denkarma, Idan dkarma) සූචිය නම් වන අතර එය රචනා වූයේ ක්‍රි.ව. 812 දී ද්පල්-ර්ත්සෙග්ස් හා නම්-ඛහ්ඉඤිස්ම්-පො නම් බෞද්ධ උගතුන් දෙදෙනකු විසිනි. ඇතැම් විට

කළ සූචියකි (Index). කෝරෝස් තම නිරීක්ෂණ සඳහා පාදක කර ගත්තේ මෙම සූචියේ වර්ගීකරණයයි.

ටන්-ජූර් පිටකයේ තන්ත්‍ර කොටසෙහි තාන්ත්‍රික විශ්වාස, තාන්ත්‍රික අභිචාර හා ඊට අදාළ උපදෙස්, මන්ත්‍ර හා ස්තෝත්‍ර දක්වා ඇත. ඇතැම් පරිච්ඡේද තන්ත්‍ර (Rgyud) නමින් ම හඳුන්වා දී ඇත. මෙම කොටස ග්‍රන්ථ 2646කින් යුතු වෙළුම් 87කින් සමන්විත අතර පරිච්ඡේද 24කට ඇතුළත් කර ඇත. පහත සඳහන් තන්ත්‍ර කොටසට අයත් ඇතැම් පරිච්ඡේද පිළිබඳ කෙටි විස්තරවලින් තන්ත්‍ර කොටසේ ආකෘතිය හා අන්තර්ගතය පිළිබඳ දළ අවබෝධයක් ලබා ගත හැකි ය.

ග්‍රන්ථ 52කින් යුතු වෙළුම් පහකින් සමන්විත පළමු පරිච්ඡේදය කාල චක්‍ර පිළිබඳ ව ය. කාල චක්‍ර සංකල්පය ඊශ්වර නිර්මාණ වාදයට අනුගත බෞද්ධ පිළිගැනීමකි. කාල චක්‍ර සංකල්පයට අනුව සියලු බුදුවරු ආදි බුද්ධ නම් පරම සත්තාවෙන් පහළ වෙති. ශක්ති නම් ස්ත්‍රී ශක්තිය හා සංයෝග වී ආදී බුද්ධ හා පසුකාලීන සියලු බුදුවරයෝ පහළ වෙති. අතිශ නම් තාන්ත්‍රික ආචාර්යවරයා මෙම සංකල්පය බුදුසමයට හඳුන්වා දුන්නේ ය. ග්‍රන්ථ 26කින් යුතු වෙළුමකින් කොටසක් වූ පස්වන පරිච්ඡේදය මහාමායාව (Great illusion) විස්තර කරයි. මහාමායා තන්ත්‍ර නම් තන්ත්‍රය පිළිබඳ විවරණයකි. එය ප්‍රපංච ලෝකයේ දෛවතත්ත්වය හා මායාවට අධිපති මහාමායා නම් දෙවියා හා එම දෙවියාට අදාළ යෝගාදිය පිළිබඳ විවරණයකි. ග්‍රන්ථ තුනකින් යුතු වෙළුමක කොටසක් වූ 6වන පරිච්ඡේදය වජ්‍ර අමෘත නම් අමරණීය පානය විස්තර කරයි. ග්‍රන්ථ හතකින් යුතු වෙළුමක කොටසක් වූ 7වන පරිච්ඡේදය බුද්ධ-කපාල තන්ත්‍රය පිළිබඳ විවරණයයි. බුද්ධ කපාල තන්ත්‍රය බුද්ධකපාල නම් තාන්ත්‍රික භාවනාවන්ට අධිපති දෙවියා පිළිබඳ ලියවුණ බුද්ධකපාල-තන්ත්‍ර පිළිබඳ විග්‍රහයකි. මෙය අනුත්තර යෝග-තන්ත්‍ර නම් තන්ත්‍රවල මාතෘ-තන්ත්‍ර (margyud) කාණ්ඩයට අයත් තන්ත්‍රයකි. ග්‍රන්ථ 196කින් යුතු වෙළුම් 16කින් සමන්විත දහවන පරිච්ඡේදය මහායෝග පිළිබඳව ය. මෙහි තාන්ත්‍රික භාවනා හා එහි විස්මජනක ප්‍රතිඵල විග්‍රහ වේ. ග්‍රන්ථ 38කින් යුතු වෙළුම් හතරකින් සමන්විත දහඅටවන පරිච්ඡේදය දුර්ගති ආපන්න සත්වයන් අඩු කරන තාන්ත්‍රික පිළිවෙත් විවරණය කරයි. එක් වෙළුමක් වූ විසිතුන් වන පරිච්ඡේදය පාපිෂ්ඨ ආත්මයන් වෙත කෙරෙන පූජා-චාරිත්‍ර සම්බන්ධයෙනි. මෙය ටිබෙටයේ මළවුන් පිදීමේ තන්ත්‍ර ප්‍රතිපත්තිවලට අදාළ ය. 24වන පරිච්ඡේදය ටන්-ජූර් පිටකයට පසුකාලීන ව එකතු වූ ග්‍රන්ථ සමූහයකින් සමන්විත ය. ඒවා අතර තාන්ත්‍රික පිළිවෙත්වල පසුකාලීන අවධියට අයත් අභිචාර විධි හා විශ්වාස සම්බන්ධ ග්‍රන්ථ දැකිය හැකි ය. උදාහරණ වශයෙන් ටිබෙට් දේව පූජාවලට අදාළ ව සකස් කරන රූප සටහන් වන මණ්ඩලයන්හි කෙරෙන පූජා, මෘත ශරීර පිළිස්සීමේ දී අනුගමනය කළ යුතු පූජා විධි, සිහින විශ්ලේෂණ, ලාදුරු රෝග නිවාරණ විධි, බලසේනා අල්ලා ගැනීමේ චාරිත්‍ර ආදී කරුණු විග්‍රහ වන ග්‍රන්ථ දැක්විය හැකි ය.

ටන්-ජූර්හි දේවන සූත්‍ර (Mdo) කොටසෙහි මුල් වෙළුම් භාරතයේ නිකායන්ගේ මූල ග්‍රන්ථවලට අටුවා වශයෙන් ලියවුණ කෘතිවලින් යුක්තය. ප්‍රඥා පාරමිතා, සද්ධර්ම පුණ්ඩරීක, ලංකාවතාර ආදි සූත්‍රවලට කළ ව්‍යාඛ්‍යාන වෙළුම් ගණනාවකින් විස්තර වේ. මීට අමතරව මාධ්‍යමික හා යෝගාචාර දර්ශනයන්ට අදාළ විවරණ ග්‍රන්ථ හැරුණු කොට බෞද්ධ ප්‍රතිපදාවට අදාළ කරුණු ද (මහායාන) භූමි, භාවනා, ආත්ම හරණ වැනි තේමා ඔස්සේ සංග්‍රහ වූ ග්‍රන්ථ මෙම කොටසට ඇතුළත් ය. ඊට අමතරව තර්ක ශාස්ත්‍රය, ව්‍යාකරණ හා වාග්වේදය, ඡන්දස් හා අලංකාර, තුල්‍යාර්ථ පද විභාග (Synonimics), තාරකා ශාස්ත්‍රය, ජ්‍යොතිශය, වෛද්‍ය ශාස්ත්‍රය, ඖෂධ වේදය හා ආචාර ධර්ම හා වෙනත් ඇල්කෙමි විද්‍යාව වැනි රසායනික විද්‍යාවන් පිළිබඳ ව ලියවුණු ග්‍රන්ථ ද සූත්‍ර කොටසට අයත් වෙයි. අවසාන වශයෙන් සඳහන් කළ කෘති සමූහය කන්-ජූර් පිටකයේ ව්‍යාඛ්‍යාන ලෙස සැලකීම අසීරු ය. එම ග්‍රන්ථයන්ගෙන් බොහෝ කෘති බෞද්ධ ග්‍රන්ථ ලෙස සැලකීම ද අසීරු ය.

මිරිස්වත්තේ විමලඥාණ හිමි